# දෙවන වාර පරීක්ෂණය - 2020 - 12 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I කොටස

### පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 1 | **11.** - 3 | **21.** - 5 | **31.** - 4 | **41.** - 3 |
| **02.** - 4 | **12.** - 3 | **22.** - 3 | **32.** - 5 | **42.** - 4 |
| **03.** - 1 | **13.** - 1 | **23.** - 3 | **33.** - 2 | **43.** - |
| **04.** - 1 | **14.** - 2 | **24.** - 4 | **34.** - 5 | **44.** - 4 |
| **05.** - 4 | **15.** - 1 | **25.** - 3 | **35.** - 1 | **45.** - 1 |
| **06.** - 5 | **16.** - 4 | **26.** - 4 | **36.** - 3 | **46.** - 1 |
| **07.** - 5 | **17.** - 4 | **27.** - 3 | **37.** - 3 | **47.** - 3 |
| **08.** - 4 | **18.** - 4 | **28.** - 4 | **38.** - 2 | **48.** - 1 |
| **09.** - 1 | **19.** - 2 | **29.** - 4 | **39.** - 1 | **49.** - 2 |
| **10.** - 3 | **20.** - 4 | **30.** - 5 | **40.** - 3 | **50.** - 1 |

## II කොටස පිළිතුරු

01. (i) සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ඩී ලැස්වෙල්ගේ නිර්වචනයයි. (ල. 2)

(ii) වේදනාත්මක දේ පිළිබඳ දරුවන්ගේ සංවේදීතාව අඩුවීම.
දරුවන් ඔවුන් ජීවත්වන පරිසරය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇති කර ගැනීම.
අන් අය සමග කටයුතු කිරීමේදී ඉක්මනින් ආක්‍රමණශීලි වීම හා ආරවුල් ඇති කර ගැනීමට නැඹුරු වීම. (ල. 4)

(iii) * සරල ව්‍යුහය * තේමාත්මක අන්තර්ගතය * නම්‍යශීලීත්වය * සංස්කෘතික සන්දර්භය
* අවම පිරිවැය **නම් කිරීමට ල. 02 විස්තර 2 x 2**

(iv) යහපත් බලපෑම
*පරිහරණය කරන පුද්ගලයාට ඇතැම් විට අන්තර්ගතය සංස්කරණය කල හැකිවීම.
*පරිශීලකයාගේ අභිමතය අනුව පරිහරණය කළ හැකිවීම.
*ග්‍රාහකයාට කැමති ලෙස පරිහරණය කළ හැකිවීම.
*ක්ෂණික බව *ජනමාධ්‍යවලට සහාය ලබාදීම
අයහපත් බලපෑම
*මානසික අවපීඩනය, කනස්සල්ල, දරුණු හුදකලාව බේද ජනක සියදිවි නසා ගැනීම් වැනි ගැඹුරු මානසික හා සමාජීය කම්පන ඇති කිරීම, සමාජිකයන්ගේ පෞද්ගලික දත්ත සමාජ ජාල සංවිධාන වෙතින් පාර්ශවයන් වෙත ලබාදීම
පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලු මතුවීම *ස්ථාන හෙළිදරව් වීම හා අවසරයකින් තොරව
*පරිශීලකයාගේ ගිණුම්වලට ඇතුළු වීම.
*සාමාජිකයන්ගේ පෞද්ගලික දත්ත සමාජ ජාල සංවිධාන විසින් වෙනත් පාර්ශවයන් වෙත ලබාදීම.
*සයිබර් හිරිහැර උවදුරු **(ලකුණු 8)**

02. (i) * ආරක්ෂකයකුගේ භූමිකාව *ගුරුවරයෙකුගේ භූමිකාව * සාකච්ඡා මණ්ඩපයක භූමිකාව **(ලකුණු 2)**

(ii) * ක්ෂණිකය * පුළුල් කලාපයක් ආවරණය කරයි * එක් දිශාවකට සංදේශය ගමන් කරයි.
* එක් වරකදී තේරුම් ගත හැකි ලෙස සංදේශය ඉදිරිපත් කළ හැකිය.
* එක් එක් ග්‍රාහක කොටස් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් ඉදිරිපත් කළ හැකිය.
* අන්තර් ජාතික, ජාතික, ප්‍රාදේශීය යන ප්‍රජා ගුවන් විදුලි ජාල ඇති කරගත හැකිය.
* ශ්‍රව්‍ය මාධ්‍යක් ලෙස පරිකල්පන ශක්තිය ගොඩනැගීම අතින් ප්‍රබල ය.
* රූපවාහිනියට සාපේක්ෂව අඩු වියදම් සහිත මාධ්‍යයකි. **(ලකුණු 4)**

(iii) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, අතථ්‍ය සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, මහජන සන්නිවේදනය, ජන සන්නිවේදනය **(ලකුණු 6)**
මූලික අදහස / විධි ක්‍රම / ප්‍රයෝජන ඇතුළත්ව විස්තර කර තිබිය යුතුය. **(ල.03)**

(iv) ජනකවි, ජනකතා, ශාන්තිකර්ම හා යාතු කර්ම, ගැමි නාටක **(නම් කිරීම ලකුණු 2) දෙකක් විස්තර කිරීමට 6)**

03. (i) දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය, පුවත්පත් කලාවේදය **(ලකුණු 2)**

(ii) * තොරතුරු හුවමාරුව සන්නිවේදනයයි. * මානව සන්නිවේදනය දෛනික ජීවිතය හා සම්බන්ධ වූවකි.
* පුද්ගල හා සමාජ සම්බන්ධතාවන්ගේ පදනම සන්නිවේදනයයි.
* සන්නිවේදනය බිඳ වැටුණු විට ඒ හා බැඳුණු සමස්ත පද්ධතියම ව්‍යාකූල වේ. **(ලකුණු 4)**


(iii) * උත්තේජනයන්ට ප්‍රතික්‍රියා දැක්වීමට
* පෞරුෂ වර්ධනයට
*තීරණ ගැනීමට
* ස්වසංකල්පය පෝෂණයට
* මතක තබාගැනීමට
* විචාරශීලීත්වය වර්ධනය කර ගැනීමට **(ලකුණු 6)**

(iv) ප්‍රතිපෝෂණය
සංදේශය නිවැරදිව ග්‍රාහයකයා ලැබුනේද යන්න දැනගත හැකිවීම.
සංදේශය නැවත සකස් කර ඉදිරිපත් කළ හැකිවීම.
සංදේශයේ සාර්ථක අසර්ථකභාවය පිළිබඳ දැනගත හැකිවීම. **(ලකුණු 8)**

04. (i) කිසියම් භාෂාවක පවතින ශබ්ද රටා සහ වචන රටා භාවිතා කරමින් සිදුකරන සන්නිවේදනය (ල. 2)
(ii) සන්නිවේදකයෝ, කේත, දොරටු පාලකයෝ, ජනමාධ්‍ය, නියාමකයෝ, පෙරහනු, ග්‍රාහක ක්ෂේත්‍රයේ, බලපෑම **(ලකුණු 4)**
(iii) තොරතුරු බෙදා ගැනීමට කෙටි පණිවිඩ යැවීමට ඡායාරූප හුවමාරුවට
පණිවිඩ යැවීමට අන්‍යයන් සමඟ සබඳතා ගොඩ නගා ගැනීමට
ව්‍යාපාර හා වෙළඳ නාම ප්‍රවර්ධනයට **(ලකුණු 6)**
(iv) දැන්වීම්කරණය තුළ , නූතන නිර්මාණ තුළ, ටෙලි නාට්‍ය චිත්‍රපට තුළ, ළමා කතා නවකතා තුළ, උදාහරණ මගින් පැහැදිලි කළ යුතුය. **(ලකුණු 8)**

05. (i) ජනමාධ්‍ය මුද්‍රිත මාධ්‍ය :- පුවත් පත්, පොත්, සඟරා
විද්‍යුත් මාධ්‍ය :- ගුවන් විදුලිය, රූපවාහිනීය **(ලකුණු 2)**
(ii) * සන්නිවේදන තාක්ෂණයේ දියුණුව * ජනමාධ්‍යයේ වර්ධනය
* මධ්‍ය විසින් සමාජය වෙත කරන ලද බලපෑමේ ස්වභාවය **(ලකුණු 4)**
(iii) ව්‍යාකරණ දෝෂ අක්ෂර දෝෂ විරාම ලකුණු දමා නොතිබීම
අක්ෂර බොද වී තිබීම මුද්‍රණ දෝෂ ආදී කරුණු විස්තර කරන්න. **(ලකුණු 6)**

(iv)




ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය, ෂැනොන් හා වීවර්ගේ ආකෘතිය සමඟ කරුණු දෙකක් සංසන්දනය කර තිබිය යුතුය.
**(රූපසටහන - 2 විස්තරයට - 2 කාරණා විග්‍රහයට 4 - මුළු ල 8)**

06. (i) අදහස්, දැනුම යනාදිය භාෂණය හෝ ලේඛනය හෝ සංඥා මගින් ප්‍රදානය කිරීම, ප්‍රකාශ කිරීම හෝ හුවමාරු කර ගැනීම. **(ලකුණු 2)**
(ii) කිසියම් අරමුණක් සඳහා ජන සමුහයක් පොළඹවා ගැනීමට හැකිවීම.
ප්‍රස්තුත කරුණු පිළිබඳ වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම සඳහා යොදා ගැනීමට හැකිවීම.
ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට උපකාර වීම.
කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතුවීම
විවිධ පාර්ශව වල අවධානය දිනා ගැනීමට හැකිවීම. **(ලකුණු 4)**

(iii) තාක්ෂණික මෙවලම් භාවිතය, ආයතනික ගත ව්‍යුවහයකින් යුතුවීම, ක්ෂණික හා අඛණ්ඩ වීම, වෘත්තීය සංනිවේදකයින් සිටීම ආදිය. **(ලකුණු 6)**

(iv) පොදු කාර්යයන් වලදී පහසුවීම.
විවිධ මතිමතාන්තර අදහස් යෝජනා ඉදිරිපත් වීම.
සහභාගි වන පරිසරය ප්‍රතිචාර, ප්‍රතිපෝෂණය ලබා ගත හැකිවීම.
දැනුම සම්පත් ආදිය බෙදාගත හැකිවීම.
ආදී කරුණු හතරක් විස්තර කිරීම. **(ලකුණු 8)**

07. (i) ගැමි නාටක යනු කිසියම් කතා පුවතක් හෝ කතා පුවත් කිහිපයකින් සැදුම් ලද්දා වූ කලා අංගයකි.
උදාඃ- කෝලම්, සොකරි, රූකඩ **(ලකුණු 2)**

(ii) ඇස උපයෝගී කොට ගෙන දැකීමෙන් හා බැලීමෙන් අදහස් හා තොරතුරු එක් රැස් කර ගන්නේ නම් එය දෘශ්‍ය සන්නිවේදනය
ප්‍රාථමික මානවයාගේ සිට නූතන මානවයා දක්වා සන්නිවේදන කාර්යය සඳහා දෘශ්‍ය සන්නි භාවිතා කර ඇත.
දෘශ්‍ය සන්නිවේදනය යන්නට සංඥා මුද්‍රණාක්ෂර, ග්‍රැෆික් නිර්මාණ, චිත්‍ර සටහන්, වර්ණ, සජීවිකරණය චිත්‍රපට ආදී වූ අංග රැසක් අයත් වේ ආදී කරුණු දෙකක් සටහන් කිරීම ප්‍රමාණවත් වේ. **(ලකුණු 4)**

(iii) සන්නිවේදන වර්ග ස්වරූප පිළිබඳව අවධානය යොමු කිරීමෙන් එහි විවිධාකාර බව පිළිබඳව මූලික අවබෝධයක් ලබාගත හැකිවේ. මේ එක් එක් සන්නිවේදන වර්ග හා ස්වරූප විවිධ වූ සන්දර්භයන්හිදී තවදුරටත් විවිධ වෙනස්කම් හා පරිවර්තන වලට භාජනය වේ. පුද්ගලාන්තර සන්නිවේදනයට වඩා කණ්ඩායම් සන්නිවේදනය වෙනස් වෙයි. කථන සන්නිවේදනයට වඩා ලිඛිත සන්නිවේදන ස්වරූපය වෙනස් වෙයි. කථන සන්නිවේදන ස්වරූපය ආගමික සන්දර්භයකදී එක ආකාරයකටත් දේශපාලන සන්දර්භයකදී ඊට වඩා වෙනස් ආකාරයකටත් සිදුවෙයි.
ආදී වශයෙන් විස්තර කර තිබිය යුතුයි. **(ලකුණු 6)**

(iv) තොරතුරු සම්පාදනය විනෝදාස්වාදය අධ්‍යාපනය
සමාජානුයෝජනය සම්බන්ධතා ගොඩනැංවීම
ආදිය විස්තර කර තිබිය යුතුය. **(ලකුණු 2 x 4 = 8වි**

NWP EXAM